**සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම් - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ (සංස්ථාව) සහ එහි පරිපාලිත සමාගම්වල (සමූහයේ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i). **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 - දේපල පිරියත හා උපකරණ**<br>----------------------------- | | |
| (අ) ප්‍රමිතයෙහි 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදිම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂා තත්ත්වයන් ඉහත දී කළ ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම ශ්‍රී.ලං.ගි.ප්‍ර අංක 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්,2020 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු. 458,337,881 ක් වූ සංස්ථාවේ ගොඩනැගිලි, කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි වැඩිදියුණු කිරීම, යන්ත්‍රෝපකරණ, මෝටර් රථ, ලීබඩු හා සවිකිරීම්, පරිගණක උපාංග, මෙවලම් හා උපකරණ සහ කාර්යාල උපකරණ වල | සංස්ථාවට අයත් දේපළ විවිධ ප්‍රදේශ වල ව්‍යාප්ත වී ඇති අතර, ලී බඩු, පරිගණක උපකරණ ආදී වත්කම් සෑම වර්ෂයකදීම සත්‍යාපණය කර අදාළ තහවුරු කිරීම් සිදු කිරීම ප්‍රායෝගිකව අපහසුය. 2021 වසරේ වත්කම් තක්සේරුවෙන් අනතුරුව අදාළ තහවුරු කිරීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ හැක. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි. | | |
| (ආ) ප්‍රමිතයෙහි 79 (ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතයට ගනු ලබන දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු වුවද, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද සහ තවමත් භාවිතයට ගනු ලබන සංස්ථාවට අයත් ගොඩනැගිලි 01 ක ,යන්ත්‍රෝපකරණ 65ක, ලී බඩු හා සවි කිරීම් 2455 ක, මෝටර් රථ 116 ක, මෙවලම් සහ උපකරණ 42 ක , කාර්යාල උපකරණ 309 ක සහ පරිගණක හා පරිගණක උපාංග 413 ක ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම් සටහන් අංක 9.3 යටතේ සංස්ථාව ඇතුළු සමූහයේ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම්වල පිරිවැය ලෙස රු.349,095,841/-දක්වා ඇති අතර එහි සඳහන් කර තිබෙන පරිදි සංස්ථාවේ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් වල පිරිවැය ලෙස රු.348,956,141/- දක්වා ඇත.<br>මෙම වත්කම්වල ධාරණ අගය 2021 වසරේ වත්කම් ප්‍රත්‍යාගණනයෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ii) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්**<br>----------------------------------<br>ප්‍රමිතයෙහි 31 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් අසම්භාව්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනානොගත යුතු වුවද, සංස්ථාව විසින් ආනයනික සහල් ව්‍යාපෘතිය යටතේ සිදු වූ තොග අස්ථානගත වීම් සම්බන්ධයෙන් විභාග වෙමින් පවතින නඩුවකින් ලැබිය යුතු බවට අපේක්ෂා කරන රු.25,900,236 ක් වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. | ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ලබා දී ඇති වාර්තාව මත සහල් ව්‍යාපෘතියේ අස්ථානගත වූ සහල් මලු ප්‍රමාණය පිළිබඳව සංස්ථාවේ සාමාන්‍යාධිකාරි විසින් ලබා දෙන ලද ලිඛිත දැණුම් දීමට අදාළව ගණනය කරන ලද පිරිවැය අනුව මෙම අස්ථානගත වූ වටිනාකම ගිණුම් තුළ දක්වා තිබේ. මේ සඳහා දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නඩුවක් පවතින නිසා නඩුවකින් ලැබිය යුතු ශේෂයන් ලෙස මෙම අගය මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය වේ. එම නිසා එය අසම්භාව්‍ය වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කර තිබේ. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලංකා සතොස සමාගමේ කොටස් සමූපකාර තොග වෙළඳ සංස්ථාව බාහිර පාර්ශවයක් | | |

| | | | |
|---|---|---|---|
| | දායකත්වය වෙනුවෙන් සංස්ථාව මූල්‍ය දායකත්වයක් ලබා දී නොමැති අතර ඒ වෙනුවෙන් සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත බද්දු පදනම මත සපයා ඇති ගොඩනැගිලි සඳහා 2005 වසරේ සිට 2011 වසර දක්වා සමුච්චිත බද්දු කුලී වටිනාකම වූ රු.66,986,483 ක් ද ලංකා සතොස අලෙවිසැල් හා ගබඩාවන්හි පරිහරණය සඳහා සංස්ථාව විසින් සපයන ලද ස්ථාවර වත්කම්වල වටිනාකම වූ 54,722,228 ක් ද වශයෙන් රු.121,708,711 ක් හිලව් කර තිබුණි. එම මුදල හිලව් කිරීම සඳහා ලංකා සතොස සමාගම විසින් නිකුත් කර ඇති කොටස් වල වටිනාකම වූ රු.22,798,840 ක් වෙනත් ආයෝජන වශයෙන් හා ඉතිරි රු.98,909,871 ක් ආයෝජන අත්තිකාරම් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල දිගුකාලීන වත්කම් යටතේ දක්වා තිබුණි. කෙසේ වුවද, ආයෝජන අත්තිකාරම් වශයෙන් දක්වා තිබූ වටිනාකම සම්බන්ධයෙන් ලංකා සතොස සමාගම විසින් එකඟතාවය පළකර නොතිබුණු අතර ලංකා සතොස සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදනය කර නොතිබුණි. | විසින් ලංකා සතොස වෙත පවරන ලද වට්ටෝරු භාණ්ඩවල වටිනාකම සහ බද්දු කුලී පදනම මත ලබා දී ඇති ස්ථාවර වත්කම් (ගබඩා සහ අලෙවිසැල් ගොඩනැගිලි) වෙනුවෙන් 2011.03.31 දක්වා වූ කාලය සඳහා වන සමුච්චිත හිඟ කුලී මුදල සතොස විසින් ලංකා සතොස වෙත ආයෝජිත ප්‍රාග්ධනය වශයෙන් සළකා කොටස් නිකුත් කිරීමට අංක 11/1353/540/017 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී ඇත.<br>ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ලංකා සතොස විසින් සතොස වෙත රු.22,798,840/- ක කොටස් නිකුත් කර ඇති බැවින්, ඉතිරි හිඟ කොටස් ප්‍රමාණය ද නිකුත් කරන ලෙස අවස්ථා කිහිපයකදීම එම ආයතනය වෙත ඉල්ලීම් කර ඇත. ඒ පිළිබඳව එම ආයතනය විසින් ප්‍රතිචාර නොදැක්වීම සහ ගිණුම්කරණ කටයුතු සිදු නොකිරීම අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු නොකිරීමක් ලෙස නිරීක්ෂණය කරමි. | විසින් එකඟතාවය පල නොකළ වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන අත්තිකාරම් වශයෙන් හඳුනා නොගත යුතුය. |
| (ආ) | ප්‍රධාන කාර්යාලය හා සතොස මෝටර්ස් පිහිටි ඉඩමේ ප්‍රත්‍යාගණිත වටිනාකම රු.2,415,000,000 ක් වුවද එහි වටිනාකම රු.2,621,600,000 ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් ඉඩම් හා ආයෝජන දේපලවල වටිනාකම රු.206,600,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම සියළුම වත්කම් 2021 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර ඇති අතර, 2021 වසරේ සිට නිවැරදිව ගිණුම්ගත කිරීම සිදු කර ඇත. | වත්කම්වල ප්‍රත්‍යාගණිත වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මාතර පිහිටි වර්ග අඩි 2944 ක් වූ ගබඩාවෙහි ප්‍රත්‍යාගණන අගය රු.3,532,800 ක් වුවද එය රු.1,177,600 වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි වටිනාකම රු.2,355,200 ක් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව මෙම වත්කම සම්බන්ධයෙන් වර්ෂයට අදාළ ක්ෂය | -එම- | -එම- |

| | | |
|---|---|---|
| වීම රු.306,176 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | | |
| (ඇ)ප්‍රත්‍යාගණන වටිනාකම රු.112,943,520 ක් වූ හිගුරක්ගොඩ පිහිටි ගොඩනැගිල්ලක් සංවර්ධනය කිරීමට අදාළ අයිතම 15 ක වටිනාකම රු.68,868,000 ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් ගොඩනැගිලි වැඩිදියුණු කිරීමේ ගිණුමේ ශේෂය රු.44,075,520 කින් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයේ ක්ෂය වටිනාකම රු. 1,763,021 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණු අතර සමුච්චිත ක්ෂය වෙන් කිරීම් ශේෂය රු. 10,576,125 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) ස්ථාවර තැන්පතු සහ කාලීන තැන්පතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු පොළිය රු.1,090,162 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද රු.1,100,000/- ක් වටිනා කාලීන තැන්පතුව 2022.08.15 දින මුදල් කර නැවතත් ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කරන ලදි.<br>එහිදී මෙම තැන්පතුව සඳහා ලද මුළු පොලී මුදල ලෙස රු.365,636.98 ක මුදලක් අප වෙත ලබා දී ඇත. 2022 වසර සඳහා රු.31,048.50 ක් ද, 2015 සිට 2021 වසර සඳහා රු.334,588.48 ක් ද ලෙස 2022 වර්ෂයේදී මෙය නිවැරදිව ගිණුම්ගත කර ඇත. | වර්ෂයට අදාළ නිවැරදි ලැබිය යුතු පොලී ආදායම ගිණුම්ගත කල යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේදී දේශීය ව්‍යාපෘතියට අදාළ සහල්වලින් ප්‍රයෝජනයට ගත නොහැකි සහල් කි.ග්‍රෑ 61,108 ක් විකිණීමෙන් ලද රු.3,755,520 ක මුදල දේශීය සහල් ව්‍යාපෘතියට අදාළ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සංස්ථාවේ වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් දේශීය සහල් ව්‍යාපෘතියේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | සත්ව ආහාර ලෙස අලෙවි කළ සහල් මෙම ව්‍යාපෘතියේ වෙනත් ආදායමක් ලෙස හඳුනාගත් අතර, එය මෙම ව්‍යාපෘතියෙන් ඉවත් කර වෙනමම නිරූපණය කර ඇත. මෙම ව්‍යාපෘතියේ ලාභය 2021 වසරේ ගිණුම් වල පෙර වර්ෂය සඳහා සකස් කරන තීරුව නිවැරදි කර ඉදිරිපත් කර ඇත. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) හඳුනානොගත් තැන්පතු රු.8,684,772 ක් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු බදුකුලී ශේෂයෙන් අඩුකර දැක්වීම සහ එම ශේෂය තුළ ඇතුළත් රු. 3,845 ක් වූ ඍණ ශේෂ හේතුවෙන් ලැබිය යුතු බදුකුලී ශේෂය | එම මුදල් වෙළඳ ආදායම් ලෙස ලද මුදල් නොවන බැවින් ද, බදු කුලී ණයගැති ශේෂවල පෙර වර්ෂයන් සඳහා ලබා ගත යුතු ණය ශේෂ දක්වා ඇති බැවින් ද, මෙම මුදල කුලී ණයගැති ශේෂයෙන් ඉවත් කර මූල්‍ය | බැංකු ජංගම ගිණුමට ලැබෙන සෘජු ප්‍රේෂණ හඳුනාගෙන නිවැරදි ගිණුම්වලට සටහන් කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු. 8,688,617 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ප්‍රකාශනවල දක්වා ඇත. | |
| (ඌ) පෙර වර්ෂයට අදාළව ගෙවන ලද රු. 367,200ක් වූ ප්‍රසාද දීමනා සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් සහ රඳවාගත් ඉපයුම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 වසරේ ප්‍රසාද දීමනා ගිණුමේ රු. 367,200 වන පෙර වර්ෂයේ ප්‍රසාද දීමනා සඳහා ගෙවන ලද හිග ගෙවීමක් ඇතුලත් කර ඇත. මේ සඳහා 2019 වසරේ වෙන්කිරීමක් සිදු කර නොමැති අතර ගණුදෙනුවේ ප්‍රමාණාත්මතාව සලකා බලා ප්‍රවර්තන වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර ඇත. | පෙර වර්ෂයට අදාළව ගෙවන ලද වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් වශයෙන් හඳුනා නොගත යුතුය. |
| (එ) 2015 සිට සමාලෝචිත වර්ෂය දක්වා ඉදිරියට ගෙන එමින් පවතින රු.3, 129,264 ක් වූ අතැති මුදල් ශේෂය භෞතිකව නොපවතින බව නිරීක්ෂණය විය. | මීට අදාළ සවිස්තරාත්මක තොරතුරු සොයාගැනීමට නොහැක. කෙසේ නමුත් ඉදිරියේදී මේ සම්බන්ධව විගණන හා කළමනාකරණ කමිටුව වෙත දැණුවත් කිරීමට නියමිත අතර එහිදී ලබාදෙන උපදෙස් අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල් ශේෂ භෞතිකව පැවතිය යුතුය. |
| (ඒ) මුදල් හා මුදල්වලට සමාන දෑ ශේෂය තුල ප්‍රාදේශීය කාර්යාල 13 කට අදාළ එකතුව රු. 1,139,783 ක් වූ බැර ශේෂ ඇතුළත් වීම හේතුවෙන් මුදල් හා මුදල්වලට සමාන දෑ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ලෙජර් ගිණුම් පරික්ෂා කරනු ලබන අතර 2021 වසරේදී නිවැරදි කිරීමට පියවර ගැනීමට නියමිතය. | මුදල් හා මුදල් වලට සමාන දෑ ශේෂය තුල ඇතුළත් බැර ශේෂ විශ්ලේෂණය කර නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඔ)ප්‍රවාහන ආදායමට අදාළ අවලංගු කරන ලද විකුණුම් ඉන්වොයිසියක් සම්බන්ධයෙන් ගිණුම් තැබීමේදී සිදු වූ දෝෂයක් නිවැරදි කිරීමේදී එකතු කළ අගය මත බදු ප්‍රතිදාන ගිණුමෙන් ඉවත් කළ යුතු රු. 2,280,006 ක් ප්‍රවාහන ආදායම් ගිණුමෙන් ඉවත් කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ප්‍රවාහන ආදායම් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වරද 2021 වසරේ නිවැරදි කර ගිණුම්ගත කර ඇත. | දෝෂ නිවැරදි කිරීමේදී නිවැරදි ගිණුම්වලට ගැලපිය යුතුය. |
| (ඕ) සංස්ථාවේ පිරිවැය මධ්‍යස්ථානයක් වූ ප්‍රවාහන අංශයේ ලාභය/ අලාභය ගණනය කිරීමේදී පිලිවෙළින් රු. 57,511,257 ක් සහ රු.25,061,462 ක් වූ ප්‍රවාහන අංශයේ සේවක වැටුප් සහ ප්‍රවාහන ආදායම ඉපයීම සඳහා යෙදවූ වාහනවලට අදාළ ඉන්ධන වියදම සැලකිල්ලට නොගැනීම හේතුවෙන් රු. 72,409,444 ක් වූ අලාභය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු. 10,163,275 ක | මෙම ඉදිරිපත් කිරීමේ දෝෂය 2021 වසරේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත. | පිරිවැය මධ්‍යස්ථාන වල ලාභය/ අලාභය නිවැරදිව හඳුනාගත යුතුය. |

ලාභයක් වශයෙන් දක්වා තිබුණි.

| | | |
|---|---|---|
| (ක) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ කොවිඩ් මෙහෙයුම් ව්‍යාපෘතියෙහි අලාභය වූ රු.16,014,339 ක් අයකරගත යුතු පාර්ශවය සම්බන්ධයෙන් නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව ලැබිය යුතු ශේෂයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, එම ව්‍යාපෘතියේ විකුණුම් අදායම් බැංකු ගත කිරීමෙන් ලද රු.1,193,128 ක් වූ පොළී අදායම ව්‍යාපෘතියෙහි අලාභය ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. | අලාභය අදාළ පාර්ශවය වෙතින් අයකර ගන්නා තෙක් ලැබිය යුතු ගිණුමක ගිණුම්ගත කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය හා විගණන හා කළමණාකරන කමිටු දී ඇති උපදෙස් පරිදි මෙම ගැළපීම සිදු කර ඇත. 2020 වසරේ සිදු වූ මෙම ගණුදෙනුවේ අලාභය ලාභාලාභ ගිණුමට ගිණුම්ගත වූවා නම් එම අලාභය 2020 වසරේදී පියවී යන බැවින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සහ විගණන කළමණාකරන කමිටු තීරණය අනුව ක්‍රියා කිරීමට නොහැකි විය හැකිය. මෙම අලාභයට වගකිව යුතු පාර්ශව හඳුනාගත් පසු මෙම මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැක. | අයකරගත යුතු පාර්ශවය සම්බන්ධයෙන් නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව අලාභ ලැබිය යුතු ශේෂ වශයෙන් ගිණුම්ගත නොකල යුතුය. |
| (ච) ඇතැම් ණයගැති ශේෂ සහ ණයහිමි ශේෂවල ඍණ ශේෂ වශයෙන් පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබියයුතු ශේෂ සහ ගෙවිය යුතු ශේෂ පිලිවෙළින් රු. 33,149,135 ක් සහ රු.21, 033,488 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ශේෂ 2017 – 2019 වර්ෂවල සහල් මිළට ගැනීම වෙනුවෙන් ගැණුම්කරුවන් වැඩිපුර ගෙවා ඇති ශේෂ වේ. එම ශේෂ ආදායම් ලෙස හඳුනාගෙන වෙන් කිරීම සඳහා අවශ්‍ය අනුමැතියන් ලබා ගෙන ඉදිරි මූල්‍ය ප්‍රකාශණ වලදී ගැළපීමට කටයුතු කර ඇත. මෙම තොරතුරු විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර එහිදී ලබා දී ඇති උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදුකරමින් පවති. | ඍණ ශේෂ වශයෙන් දක්වා ඇති ණයහිමි ශේෂ සහ ණයගැති ශේෂ විශ්ලේෂණය කර නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු | | |
| බදුකුලී ආදායම | 265,489,302 | 258,585,967 | 6,903,335 | 2021 වසරේ සිට නිවැරදි ලේඛණ ඉදිරිපත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී. | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම අනුරූපී වාර්තා අනුව වටිනාකම සමග සැසදිය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| ලංකා සතොස සමාගමෙන් සංස්ථාව වෙත අයවිය යුතු මුදල | 2,290,445,474 | 1,924,384,456 | 366,061,018 | ලංකා සතොස සමාගම වෙත ශේෂ සනාථ කිරීමේ ලිපි යොමු කරන ලද නමුත්, ඒ සඳහා ඔවුන් විසින් පිළිතුරක් සංස්ථාව වෙත යොමු කර නොමැත. එමනිසා ශේෂ සනාථ කිරීමේ කටයුතු කිරීමට නොහැකිව ඇත. ඉදිරි ගිණුම් වර්ෂයේදී ශේෂ සනාථන ලබාගෙන සැසඳීම් කිරීමට කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම අනුරූපී වාර්තා අනුව වටිනාකම සමග සැසදිය යුතුය. |

### 1.5.4 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පරිපාලිත සමාගම් වන සී/ස සීඩබ්ලිව්ඊ සිකියුරිටීස් ඇන්ඩ් ජෙනරල් සමාගම සහ සී/ස සීඩබ්ලිව්ඊ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉංජිනියරින් සමාගම යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකළ සහ විගණනයට භාජනය නොකළ මූල්‍ය ප්‍රකාශන යොදා ගෙන තිබුණි. | සී/ස.සතොස ආරක්ෂක (පොදු) පෞද්ගලික සමාගම වෙත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන ලෙස දැණුම් දී තිබේ. එබැවින් ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පියවර ගෙන ඇත. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිපාලිත සමාගම් වල ගිණුම් යොදාගත යුතුය. |

### 1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ සංස්ථාවේ මුළු වත්කම් ඉක්ම වූ මුළු වගකීම් රු.2,941,269,573 ක් මෙන්ම ජංගම වත්කම් ඉක්ම වූ ජංගම වගකීම් රු.1,089,127,686 ක් වූ අතර ඒ හේතුවෙන් සමාගමට සිය වත්කම් තුළින් එහි වගකීම්වලට මුහුණ දීමේ හැකියාව සහ භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීමකින් තොරව අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. | එකඟ වෙමි. ආනයනික සහල් ව්‍යාපෘතිය වෙනුවෙන් මහජන බැංකුව වෙතින් ලබාගත් ණය මුදල් හා ඒ මත එකතු වී යන පොලී මුදල නිසා සංස්ථාවේ වගකීම් වත්කම්වලට සාපේක්ෂව ඉහළ අගයක් ගෙන ඇත. 2021 වසරේ සිට මෙම ණය මුදලින් බිලියන 3.6 ක කොටසක් හා එම පොලී මුදල මහා භාණ්ඩාගාරය වෙතින් අමාත්‍යාංශය හරහා | සංස්ථාවේ වගකීම් වලට මුහුණ දීමට හැකි වත්කම් තත්වයක් පවත්වා ගත යුතුය. |

සංස්ථාව වෙත ලබා දෙන අතර, 2021 වසරේ ජුලි මස සිට මේ දක්වා අඛණ්ඩව එම මුදල් මහජන බැංකුව වෙත ගෙවා ඇත.
මීට අමතරව ණය මුදලේ ඉතිරි මුදල වන බිලියන 2.1 සඳහා ලංකා සතොස ආයතනය විසින් මිළට ගත් සහල් වෙනුවෙන් සංස්ථාව වෙත ගෙවිය යුතු මුදල් 2022 සැප්තැම්බර් මස සිට රු.මිලියන 25 බැගින් ගෙවීමට කටයුතු කර ඇත. ඉදිරියේදී මෙම ණය මුදල අඩුවීම හේතුවෙන් හා 2021 වසරේ සිදුවන වත්කම් ප්‍රත්‍යාගණනය මගින් ආයතනයේ වත්කම් හා වගකීම් නිසි පරිදි කළමණාකරනය කර ගැනීමට හැකි වේ යැයි අපේක්ෂා කරමු.

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) නඩුවකින් ලැබිය යුතු ශේෂ | 25,900,236 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන | මේ සඳහා දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නඩුවක් පවතින නිසා නඩුවකින් ලැබිය යුතු ශේෂයන් ලෙස මෙම අගය මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කර ඇත. | අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (ii) භාණ්ඩාගරයට ගෙවිය යුතු ශේෂ<br>------------------ | | | | |
| - ණය පියවීම් | 98,718,402 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන | මේ සම්බන්ධව තහවුරු කිරීමේ ලිපියක් මහජන බැංකුව වෙතින් ඉල්ලා සිටි අතර, එම තහවුරුව ලද විගස විගණනයට යොමු කරන ලෙස උපදෙස් දී ඇත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| - ණය ප්‍රතිව්‍යුහගත කිරීම් | 275,000,000 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන | 2006 වසරේ සිදු වූ මෙම ගණුදෙනුවලට සම්බන්ධ වටිනාකම තහවුරු කිරීමේ ලේඛන සතොස මූල්‍ය අංශයේ නොමැත. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| - සතොස සිල්ලර සමාගම(SRL) ණයහිමියෝ | 655,000,000 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන | 2003වසරේ සතොස සිල්ලර සමාගම ඇවර කරන ලද අතර ,මෙම ශේෂයන් 2003 වසරේ සිට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම සිදු කරනු ලබයි. දැනට වසර 18 කට පෙර සිදු වූ මෙම ගණුදෙනු පිළිබඳ වටිනාකම තහවුරු කිරීම සඳහා මූල්‍ය අංශය සතුව ඇති ලේඛන විගණනය වෙත ඉදිරිපත් කර ඇත. | අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| - බැංකු වගකීම් | 225,000,000 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන | -එම- | -එම- |
| - ලද විකුණුම් වටිනාකම | 680,000,000 | ලද විකුණුම් වටිනාකම තහවුරු කිරීමේ ලේඛන. | -එම- | -එම- |
| - On SRL | 200,000,000 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන | 2003 වසරේ සතොස සිල්ලර සමාගම ඇවර කරන ලද අතර ,මෙම ශේෂයන් 2003වසරේ සිට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම සිදු කරනු ලබයි .දැනට වසර 18 කට පෙර සිදු වූ මෙම ගණුදෙනු පිළිබඳ වටිනාකම තහවුරු කිරීමට ලේඛන කිසිවක් මූල්‍ය අංශයේ නොමැත. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| - On paddy project | 254,149,693 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන | මෙම ශේෂය සතොස සිල්ලර සමාගම විසින් එම සමාගම ඇවර කරන අවස්ථාවේදී වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතු වූ ශේෂය වන අතර එම ශේෂය සඳහා 2003 වසරේදී භාණ්ඩාගාර බැදුම්කර නිකුත්කර ඇත. මෙම ගණුදෙනු පිළිබඳ වටිනාකම තහවුරු කිරීමට ලේඛන කිසිවක් මූල්‍ය අංශයේ නොමැත. | -එම- |
| (iii) දිගුකාලීන හිඟගිටි වෙළඳ ණයගැති ශේෂය | 6,214,481 | ලෙජර ගිණුම්, ඉන්වොයිසි , ලදුපත්, හානිකරණය සඳහා අනුමැතිය | මෙම එක් එක් ලෙජර් ගිණුම් 2011 ට පෙර සිට පැවත එන අතර ,එම ලේඛණවලට අදාළ තොරතුරු දැනට මූල්‍ය අංශය තුළ නොමැත . දිගුකාලීනව පැවතෙන ශේෂ ඉදිරියේදී කපාහැරීමේ කමිටුවට ඉදිරිපත් කිරීමට උපදෙස් දී ඇත. | -එම- |
| (iv) දිගුකාලීන හිඟගිටි වෙනත් ණයගැතියෝ | 170,370,348 | ඉන්වොයිසි , ලදුපත්, කාල විශ්ලේෂණ , හානිකරණය සඳහා අනුමැතිය | 2011 වසරේ සිට නොවෙනස්ව පවතින ගිණුම් ශේෂ බොහෝ කාලයක් ගිණුම්වල පවතින බැවින් ,ගිණුම් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි . එම ශේෂයන් සනාථ කිරීම සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැති බැවින් , ඒවා අයකර ගැනීමට හැකියාවක් නොමැති නිසා ගිණුම් ප්‍රමිත අංක 36 පරිදි හාණිකරණ සඳහා වෙන් කිරීම් සිදු කර ඇත. දිගුකාලීනව පැවතෙන ශේෂ ඉදිරියේදී කපාහැරීමේ කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. | -එම- |
| (v) වෙනත් ණයගැතියෝ- ගමට | 42,568,994 | ඉන්වොයිසි , ලදුපත් | මෙම ව්‍යාපෘතිය 2014/2015 කාල සීමාව | අදාළ සාක්ෂි විගණනයට |

| | | | | |
|---|---|---|---|---|
| සවිය ව්‍යාපෘතිය | | | තුළ සිදු කර ඇත. එම ලේඛන මූල්‍ය අංශයේ ගබඩා තුළ තිබේදැයි පරීක්ෂාකර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. | ඉදිරිපත් කල යුතුය. |
| (vi) දිගුකාලීන හිගගිටි කුළී ණයගැතියෝ | 88,071,071 | ලෙජර ගිණුම්, ඉන්වොයිසි , ලදුපත් කාල විශ්ලේෂණ | 2011 වසරේ සිට නොවෙනස්ව පවතින ගිණුම් ශේෂ බොහෝ කාලයක් ගිණුම්වල පවතින බැවින් ,ගිණුම් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි . එම ශේෂයන් සනාථ කිරීම සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැති බැවින් , ඒවා අයකර ගැනීමට හැකියාවක් නොමැති නිසා ගිණුම් ප්‍රමිත අංක 36 පරිදි හාණිකරණ සඳහා වෙන් කිරීම් සිදු කර ඇත. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| (vii) සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු<br>- සී/ස සතොස සිල්ලර සමාගම | 110,878,720 | ලැබිය යුතු ශේෂය සම්බන්ධ ලිපි ලේඛන | 2003 වසර හා ඊට පෙර වර්ෂවල සිදු වූ ගණුදෙනු සම්බන්ධ ලිපි ලේඛන මේ වන විට සතොස මූල්‍ය අංශය සතුව නොමැත. මේ අගය පිළිබඳව ඉදිරියේදී කපා හැරීම් කමිටුව වෙත වාර්තා කර ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. | -එම- |
| - සී/ස ලංකා සතොස | 24,202,985 | ලැබිය යුතු ශේෂය සම්බන්ධ ලිපි ලේඛන | මෙම ශේෂය පරිපාලිත සමාගම්වල පවතින ජංගම ගිණුම් ශේෂය යටතේ ලංකා සතොස ලිමිටඩ් වෙතින් ලැබිය යුතු ශේෂයක් ලෙස 2010 මූල්‍ය වාර්තාවල සඳහන් කර තිබේ. අප විසින් දැනට ගිණුම් කටයුතු සිදු කරනු ලබන Busy පද්ධතිය තුළ 2011 වසරේ සිට ලෙජර් ගිණුම් ශේෂ | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | පමණක් ඇතුලත් කර ඇති නිසා ඉන් පෙර වසරවල ලෙජර් ගිණුම් මූල්‍ය අංශය සතුව නොමැති අතර ඒවා පරික්ෂා කිරීමට හැකියාවක් නොමැත .එම නිසා මෙම ශේෂය සකස් වී ඇති ආකාරය පිලිබඳව පිළිතුරු ලබා දීමට ප්‍රමාණවත් සාක්ෂි මූල්‍ය අංශය සතුව නොමැත. | |
| (viii) | ව්‍යවස්ථාපිත ලැබිය යුතු ශේෂ ජාතිය ගොඩනැගීමේ බදු | 234,321,615 | ලැබිය යුතු ශේෂය සම්බන්ධ ලිපි ලේඛන | මෙය සංස්ථාව විසින් 2001 වර්ෂයේ සිට දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට ගෙවන ලද ජාතික ආරක්ෂක බදු මුදලේ එකතුවයි. මෙම ශේෂය 2003 සිට ගිණුම්වල නිරූපණය වේ. අප විසින් මේ පිලිබඳව දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව වෙතින් විමසා සිටි අතර ඔවුන් විසින් .ගෙවන ලද බදු වටිනාකම හිලව් කිරීම සඳහා අදාල බදු ලේඛණ ඉල්ලා සිටි නමුත් මේ සම්බන්ධව කිසිදු ලේඛනයක් මූල්‍ය අංශය සතුව නොමැත. | -එම- |
| (ix) | දිගුකාලීන හිගගිටි වෙළඳ ණය හිමි ශේෂය | 3,519,166 | ඉන්වොයිසි, ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ශේෂ සඳහා අදාළ ඉන්වොයිස් සම්බන්ධ ලිපි ලේඛන කිසිවක් සංස්ථාව සතුව නොමැත. මේ අගය පිළිබඳව ඉදිරියේදී කපා හැරීම් කමිටුව වෙත වාර්තා කර ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. | -එම- |
| (x) | දිගුකාලීන හිගගිටි වෙනත් ණය හිමි ශේෂ | 187,678,063 | ඉන්වොයිසි, ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ශේෂයන් 2011 වසරට පෙර සිට මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය වේ .මේ සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැති බැවින් , මෙම ශේෂ කපා හැරීමේ | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | | කමිටුවට ඉදිරිපත් කර ගිණුම්වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. | |
| (xi) ගෙවිය යුතු එකතු කල අගය මත බදු | 187,711,507 | ගණනය කිරීම් හා ගෙවීම් | මෙම ශේෂය සකස් වී ඇත්තේ ගිණුම් ශේෂ 03 ක එකතුවෙනි. | අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (xii) හිලව් කළ බදු බැර | 9,000,000 | ගණනය කිරීම් | 2020 වර්ෂය තුළ රු.9,000,000.00 මුදලක් දේශීය අදායම් දෙපාර්තුමේන්තුව වෙත ගෙවන ලද අතර මෙම ගෙවීම සිදුකරන ලද්දේ 1995 - 2009 වර්ෂ සඳහා ගෙවිය යුතු නමුත් ගෙවීම පැහැර හරින ලද භාණ්ඩ හා සේවා බද්ද වෙනුවෙනි. 1995 - 2009 වසරවල දේශීය අදායම් දෙපාර්තුමේන්තුවට යොමු කරන ලද බදු වාර්තා කිසිවක් සංස්ථාව සතුව නොමැති අතර මේ සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව විසින් යොමුකරන ලද ලේඛන අනුව මෙම බදු මුදල ගෙවා ඇත. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| (xiii)තැන්පතු සහ අත්තිකාරම් - දිගුකාලීන | 29,692,440 | තැන්පතු ලදුපත් | 2011 වසරේ සිට නොවෙනස්ව පවතින ගිණුම් ශේෂ බොහෝ කාලයක් ගිණුම්වල පවතින බැවින් ,ගිණුම් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි . එම ශේෂයන් සනාථ කිරීම සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැත. ඒවා අයකර ගැනීමට හැකියාවක් නොමැති නිසා හාණිකරන සඳහා වෙන් කිරීම් සිදු කර ඇත . | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| (xiv) | වෙනත් ආයෝජන - සතොස රිටේල් සමාගම | 171,928,690 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන | මෙම ශේෂයන් 2011 වසරට පෙර සිට මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය වේ .මේ සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැත. | -එම- |
| (xv) | ලැබිය යුතු පොලී ගිණුමේ 2018 ජනවාරි 01 ශේෂය | 1,039,739 | ස්ථාවර තැන්පතු වලට අදාළ බැංකුවෙන් ලද අළුත් කිරීමේ නිවේදන | මෙම ගිණුමේ ශේෂය 2013 වසරේ ගිණුම්වල පැවත එන ශේෂයකි. 2019 වසරට අදාළ පොළී ලැබීම නිවැරදිව ගැලපීම සිදුකර ඇත. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (xvi) | විශේෂ ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ශේෂ ---------------------------- | | | | |
| | - Crate payables | 7,731,857 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ව්‍යාපෘතිය 2011 පෙර වර්ෂවල ක්‍රියාත්මක වී ඇත. මේ වන විට මෙම ලේඛන මූල්‍ය අංශයේ නොමැත | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| | - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 19,926,051 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ශේෂය සමුපකාර සංවර්ධන දෙපාර්තුමේන්තුව විසින් සතොස වෙත 2011 වසරේදී ලබාදුන් ණය මුදලක් ලෙස ගිණුම්වල දක්වා ඇත. 2012 වසරේ සිට රු.19,926,051.00 මුදලක බැර ශේෂයක් මෙම ගිණුමේ දක්වා ඇත. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| | - Millers Payables | 47,753,691 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ශේෂය තුළ ඇතුලත් වන රු. 16,500,960/ක ශේෂය 2011 පෙර සිට පැවත එන ශේෂයක් වේ. මෙම ශේෂ පිළිබඳව මූලාශ්‍ර ලේඛන නොමැති බැවින් කපා හැරීම සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. ඉතිරි ශේෂ 2011 පසු 2017 දක්වා ලෙජර් ගිණුම්වල පවතින ශේෂ වේ. මෙම ශේෂ සැසදීම් කර 2021 වසරේ ගිණුම් වල දැක්වීමට කටයුතු | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | කරමි. | |
| - | ඇසුරුම් ද්‍රව්‍ය | 10,191,665 | ඉන්වොයිසි, ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ව්‍යාපෘතිය 2011 වසරේ සිට 2014 දක්වා ක්‍රියාත්මක කර ඇති අතර මූලාශ්‍ර ලියවිලි මූල්‍ය අංශයේ නොමැත. | -එම- |
| - | ප්‍රවාහන | 5,275,761 | ඉන්වොයිසි, ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | . -එම- | -එම- |
| - | ආපසු ගෙවියයුතු තැන්පතු (Millers) | 4,605,106 | ගෙවීම් ලදුපත් | -එම- | -එම- |
| - | Other Paddy Operations | 11,523,151 | ඉන්වොයිසි, ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | -එම- | -එම- |
| - | ඉරිඟු ව්‍යාපෘතිය(Maize Project) | 16,442,700 | ඉන්වොයිසි, ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ව්‍යාපෘතිය 2016-2017 වර්ෂවල ක්‍රියාත්මක වී ඇත. මෙහිදී CIC Grain ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලියවිලිවල මුල් පිටපත් නොවූ බැවින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් පත් කරන ලද ගෙවීම් කමිටුව විසින් එම ගෙවීම රදවා ගන්නා ලදී. මෙහි සදහන් වන්නේ එම ආයතනයට ගෙවීම සදහා වන ඉතිරි මුදලයි. මෙම ව්‍යාපෘතියට අදාළ ලේඛණ විගණන අංශය වෙත යොමු කිරීමට කටයුතු කරමි. | අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| - | සහල් අපනයන ව්‍යාපෘතිය | 22,797,153 | ඉන්වොයිසි, ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ව්‍යාපෘතිය 2013/2014 වසරවල ක්‍රියාත්මක කර ඇත. 2013.07.31 දින සතොස ප්‍රධාන | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත |

| | | |
|---|---|---|
| | කාර්යාලයේ ඇති වූ හදිසි ගිනි ගැනීම හේතුවෙන් ආයතනය සතු පැරණි ලිපි ලේඛන රාශියක් විනාශයට පත් විය. ඒ හේතුවෙන් මෙහි සඳහන්ව ඇති සමහර ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැත. | යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාව විසින් ආනයනික සහල් ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත රු.436,164,234 ක් වටිනා සහල් තොග විකුණා තිබුණු අතර , ඒ සඳහා 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති රු.118,011,334 ක මුදල පියවීම සඳහා ලබාදී තිබුණු සියළුම චෙක්පත් අගරු වී තිබුණි. සංස්ථාව විසින් ණය පදනම මත සහල් ලබාදීමේදී රු.100,000,000 ක බැංකු ඇපකර 02 ක් ලබාගෙන තිබුණු අතර එම ඇපකර සත්‍ය ලේඛන බවට තහවුරු කර ගෙන නොතිබුණි. තවද සමාගම විසින් දිගින් දිගටම ණය නොගෙවා සිටියදී ද සමාගම වෙත අඛණ්ඩව සහල් නිකුත් කර තිබුණු අතර මෙම බැංකු ඇපකර සාවද්‍ය ලේඛන බවට හෙළිදරව් වී තිබුණි. මෙම මුදල් ගෙවීම පැහැර හැරීම නිසා සංස්ථාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාගවෙමින් පැවතුණි. | සමුපකාර තොග වෙළඳ සංස්ථාවෙන් ආනයනික සහල් තොග ලබාගෙන රු.118,011,334/- මුදලක් වංචා කිරීම සම්බන්ධව , අගරු චෙක්පත් ලබාදීම සහ ව්‍යාජ බැංකු ඇපකරයක් ලබාදීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට පැමිණිලි කර ඒ සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතරම, කොළඹ වාණිජ මහාධිකරණයේ සිවිල් නඩුවක් ද මේ සම්බන්ධයෙන් විභාග වෙමින් පවතී. | ණය පදනමින් භාණ්ඩ සැපයීමේදී අය කර ගැනීමේ හැකියාව තහවුරු කර ගත යුතුය. |
| (ආ) ආනයනික සහල් විකිණීම වෙනුවෙන් ගැනුම්කරුවෙකුගෙන් අයවිය යුතු මුදල වශයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,574,811 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ණය පදනම මත සහල් ලබාගත් බව ගැනුම්කරු විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් අපරාධ | ආනයනික සහල් විකිණීම වෙනුවෙන් ඩබ්.ආර් විජිත යන අයට විරුද්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇති අතර, ඒ අනුව විමර්ශන කටයුතු ආරම්භ කර ඇත. දැනට ප්‍රකාශ ලබාගැනීම් සිදුකර ඇත. තවද | -එම- |

| | | |
|---|---|---|
| පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත සංස්ථාව විසින් පැමිණිලි කර තිබුණි. | ඩබ්.ආර්. විජිත යන අයට සහල් විකිණීම හා මුදල් ලැබීම් සම්බන්ධව සම්පූර්ණ විගණනයක් සිදුකර විගණන වාර්තාවක් ලබාදෙන ලෙස අපරාධ පරීක්‍ෂණ දෙපාර්තමේන්තුව දැනුම්දී ඇති අතර, ඒ අනුව ස්වාධීන විගණනයක් සිදුකර අදාල විගණන වාර්තාව අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව වෙත භාරදී ඇත. | |
| (ඇ) දීර්ඝ කාලයක් මුළුල්ලේ ලැබිය යුතු බදු කුලී ලෙස දක්වා තිබුණු රු.88,071,071 ක මුදල අයකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කාලයක් පැවතෙන මෙම ශේෂයන් සඳහා මුදල් ලබා ගැනීමේ ශක්‍යතාවය ඌන වී ඇති බැවින් ගිණුම් ප්‍රමිත අංක **36** ලබා දී ඇති උපදෙස් පරිදි හානිපූරණ වෙන් කිරීම් සිදුකර ඇත. මේ සම්බන්ධව අදාල ගෙවීම් සිදුකරන ලෙස එම ආයතන වෙත දැනුම්දීම් සිදු කර ඇත. | ලැබිය යුතු බදු කුලී අය කර ගත යුතුය. |
| (ඉ)සම්බන්ධිත පාර්ශවයන්ගෙන් අයවිය යුතු ශේෂය වශයෙන් වූ රු.24,202,985 ක මුදල සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන නොතිබුණි. | මෙම ශේෂය පරිපාලිත සමාගම්වල පවතින ජංගම ගිණුම් ශේෂය යටතේ ලංකා සතොස ලිමිටඩ් වෙතින් ලැබිය යුතු ශේෂයක් ලෙස 2010 මූල්‍ය වාර්තාවල සඳහන් කර තිබේ. මෙහි දක්වා ඇති ශේෂය අයකර ගැනීමට හැකියාවක් නොමැති බැවින් ගිණුම් ප්‍රමිත අංක 36 දක්වා ඇති පරිදි හානිකරණය සඳහා වෙන්කිරීම් සිදුකර මූල්‍ය වාර්තා සකස් කර ඇත. | ලැබිය යුතු මුදල් අය කර ගත යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලංකා සතොස සමාගමෙන් සහ වී අලෙවි මණ්ඩලයෙන් සංස්ථාව වෙත අයවිය යුතු මුදල පිළිවෙලින් රු.2,290,445,474 ක් සහ 94,059,338 ක් වූ අතර සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත සහ වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු 89,228,614 ක් සහ රු.1,000,666,192 ක් වී තිබුණි. මෙම අයවිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් වසර | ආනයනික සහල් සහ දේශීය සහල් අලෙවිය වෙනුවෙන් ලැබිය යුතු මුදල් ගෙවීම සඳහා ලංකා සතොස විසින් ගෙවීම් සැලැස්මක් යෝජනා කර ඇත. 2022.08.03 දින වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා පිළිබඳ අමාත්‍යාංශයේ පැවති රැස්වීමේදී ලංකා සතොස විසින් 2022 සැප්තැම්බර් 01 | අදාල ආයතන සමග එකගතාවයකට පැමිණ ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ නිරවුල් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර එම ශේෂයන් නිරවුල් කර ගැනීමට වාර්තාවේ දිනය දක්වාද කටයුතු කර නොතිබුණි. | දින සිට මාසිකව රු.25,000,000 වසර 06 තුළ සතොස වෙත ගෙවීම් කිරීමට එකඟ විය. ලංකා සතොස විසින් සතොස ආයතනයෙන් දේශීය සහල් ලබා ගැනීම වෙනුවෙන් ලැබිය යුතු මුදල් 2022.09.01 දින සිට වාරික ලෙස සතොස වෙත ගෙවීමට එකඟ වූ බැවින් එම මුදල් වලින් . වී අලෙවි මණ්ඩලයට සතොස විසින් ගෙවීමට ඇති මුදල් ගෙවීමට කටයුතු කරමින් පවතී.<br>තවද මෙම ආයතනවලින් ශේෂයන් සැසඳීමට සහ අය කරගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සේවකයින් පත් කර ඇති අතර ඔවුන් විසින් අදාල කටයුතු සිදුකරන බව දන්වමි. මේ අනුව සංස්ථාව විසින් අදාල ශේෂ අයකර ගැනීමටත් සැසඳීම් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇත. | |
| (උ) | විවිධ ණය ගැතියන්ගෙන් සංස්ථාවට අයවිය යුතු රු.45,623,784 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | මෙහි දක්වා ඇති ශේෂය අයකර ගැනීමට හැකියාවක් නොමැති බැවින් ගිණුම් ප්‍රමිත අංක 36 දක්වා ඇති පරිදි හානිකරණය සඳහා වෙන්කිරීම් සිදුකර මූල්‍ය වාර්තා සකස් කර ඇත. සියළු ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් පරිදි ආයතනය තුළ කමිටුවක් පත්කර තිබෙන අතර, ඔවුන් විසින් මෙම ශේෂ සැසඳුම් කර අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් ඇත. ඔවුන්ට ප්‍රගතිය අංශ ප්‍රධානීන් හරහා කළමණාකාරීත්වයට වාර්තා කිරීම් සිදු කිරීමට අදාළ උපදෙස් ලබා දී ඇත. | ලැබිය යුතු මුදල් අය කර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1992 මුදල් රෙගුලාසි විධිවිධාන සංශෝධනය කිරීම සඳහා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 11.1 ඡේදය | අදාළ මුදල් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර සිදු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මෙම වාර්තාවේ දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. | 2020 වසරේ පැවති කොවිඩ් තත්ත්වය යටතේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත පරිදි සිදු කළ නොහැකි වූ අතර, 2021 වසරේ සිට එම කටයුතු නිසි පරිදි සිදු කර තිබෙන බව දන්වා සිටිමි. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියමිත කාලය තුළ සිදු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 618, 975,255 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුවරු. 1,003,047,978 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 384,072,723 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සංස්ථාව ක්‍රියාත්මක කල දේශීය සහ ආනයනික සහල් ව්‍යාපෘති වල අලාභය රු. 364,684,705 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 වර්ෂයේ ඉදිරිපත් කර ඇති වත්කම් ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් මිල ගණන්වලට වඩා අඩුවෙන් වර්ග අඩියක මිල නියම කිරීම හේතුවෙන් බදු දෙන ලද දේපලවලින් සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවට අහිමි වූ ආදායම රු.83,797,095 ක් වී තිබුණි. | ප්‍රත්‍යාගනන වාර්තාවේ සඳහන් මිල ගණන් වලට අඩුවෙන් ලබාදී ඇති සමහර ගබඩා / දේපල අදාල බදු ගැනුම්කරු විසින් එකී ගබඩාව අලුත්වැඩියා කිරීම සඳහා සිය අරමුදල් යොදා ගෙන ඇති අතර ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබාගැනීමට සහ සමහර දේපල සඳහා තක්සේරු වාර්තා ලබාගැනීමටද කටයුතු කර ඇත. එසේම සමහර ගබඩා / දේපල සතොස ආයතනයේ සහෝදර සමාගමක් වන ලංකා සතොස ආයතනය වෙත සහ සතොස ආයතනයේ පරිපාලිත සමාගම් සඳහා කුලී පදනම මත ලබාදී තිබුණි. | ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් මිල ගණන් අනුව බදු කුලී අය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත ලබාදී ඇති භාණ්ඩ තොග ප්‍රවාහන සේවාව වෙනුවෙන් 2018 හා 2019 වර්ෂයන් සඳහා ලැබිය යුතු ආදායමින් ප්‍රවාහනයේදී සිදු වී ඇති මාර්ගස්ථ අඩුමාන හේතුවෙන් ඉන්වොයිස් වටිනාකමින් රු.19,299,267 ක ආදායමක් අහිමි වී තිබුණු අතර එය මෙම වාර්තාවේ දිනය දක්වා අයකර ගෙන නොතිබුණි. | ලංකා සතොස භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදවන ලද ලොරි රථවලින් සිදු වී ඇති අඩුමාන සඳහා වගකිව යුතු සේවකයින්ට එරෙහිව පරීක්ෂණ සිදු කර අලාභ අයකර ගැනීමට හා විනයානුකූල පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | මාර්ගස්ථ අඩුමාන වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගත යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව සතු දේපල අතුරින් කුලියට දීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවති වර්ග අඩි ප්‍රමාණය 177,036 ක් වූ අතර, 2015 වර්ෂයේ ඉදිරිපත් කර ඇති වත්කම් ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් බදු කුලිය අනුව මෙම ගොඩනැගිලි නිශ්කාර්යව පැවතීමෙන් වාර්ෂිකව රු.80,401,440 ක ආදායමක් සංස්ථාවට අහිමි වී තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව සතු දේපල කුලියට ලබාදීම සඳහා රටේ පැවති කොවිඩ් වසංගත තත්වය තුළ නිරෝධායන ඇඳිරිනීතිය ,සංචරණ සීමා සහ කාර්යාලවලට පැමිණීම සීමා කිරීම වැනි හේතු මත ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට හැකියාවක් නොතිබූ අතර 2021 වර්ෂය තුළ එකි දේපල කුලි පදනම මත ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවීමට සංස්ථාව විසින් කටයුතු කර තිබුණි. | සංස්ථාවේ දේපල ආදායම් ඉපයීම සඳහා කාර්යක්ෂමව යොදාගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ 10 කට අධික කාලයක සිට පැවත එන අක්‍රීය බැංකු ගිණුම් වල පැවති හඳුනා නොගත් හර ශේෂ සහ ගිණුම් අතර මුදල් මාරු කිරීම නිසි පරිදි කළමනාකරණය නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 04 ක එකතුව රු. 8,510,280 ක හර ශේෂ නිරූපණය වී තිබුණි. | බැංකුව වෙත ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව බැංකුවේ ජංගම ගිණුම් වල රු.100,000/- ක ශේෂයක් පමණක් රඳවාගෙන ඉතිරි මුදල බැංකු ඉතිරි කිරීමේ ගිණුම් අංක 2030013001 හී තැන්පත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 1415160701 ගිණුමට තැන්පත් වන මුළු මුදලින් රු.100,000/- ක ශේෂයක් රඳවා ගෙන ඉතිරි මුදල් ඉතිරි කිරීම් ගිණුමේ තැන්පත් වන | අක්‍රීය බැංකු ගිණුම් සම්බන්ධයෙන් අදාළ බැංකු සමග එකගතාවයකට පැමිණ නිරවුල් කළ යුතු අතර ගිණුම් අතර මුදල් මාරු කිරීම නිසි පරිදි කළමනාකරණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අතර 1415160701 ගිණුමේ නිකුත් කරන ලද චෙක්පත් වල වටිනාකම පමණක් ඇතුලත් වන බැවින් සෑම විටම එම ගිණුමේ ශේෂය බැර ශේෂයක් වේ. ඉදිරි විගණන හා කළමණාකරන කමිටුවේදී මේ සම්බන්ධව සාකච්ඡා කර 2022 සිට මෙම ශේෂය නිවැරදිව ගිණුම්වල නිරූපණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.<br>අනෙකුත් බැංකු ගිණුම් ශේෂ වර්ෂ 10 කට අධික කාලයක සිට පැවත එන අක්‍රීය බැංකු ගිණුම් වන අතර මෙම ශේෂ කපා හැරීමේ කමිටුව සහ විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ඒ සම්බන්ධව ලබා දෙන උපදෙස් ප්‍රකාරව කටයුතු කරමි. | |
| (ආ)හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව ගබඩා තුළ ගබඩා කර තිබුණු ආනයනික සුදු සහල් , ආනයනික නාඩු සහල් , දේශීය සම්බා සහල් සහ රතු නිවුඩු යන වර්ගවලට අයත් සහල් කි.ග්‍රෑ. 83,837 ක් සමාලෝචිත වර්ෂය තුළදී රු.4,911,230 ක මුදලකට සත්ව ආහාර වෙනුවෙන් විකුණා තිබුණු අතර මෙවැනි හානි වළක්වා ගැනීම සඳහා කලමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | හිගුරක්ගොඩ හා පන්නගමුව සහල් සංකීර්ණ ආශ්‍රිත ගබඩාවල ආනයනික හා දේශීය සහල් තොග රැස් කිරීම සිදු කළ අතර මෙහෙයුම් සිදු කරනු ලැබූ තොග ප්‍රමාණය ඉතා විශාලය .<br>මෙම තොග ප්‍රමාණයන් ගබඩාගතව පැවති කාලය , පැවති කාලගුණික තත්වය සහ මෙහෙයුම් කටයුතු හේතුවෙන් ඉවත්වන තොග මනුෂ්‍ය පාර්භෝජනයට සුදුසු නොවන බැවින් සත්ව ආහාර සඳහා අලෙවි කිරීම වඩාත් ඵලදායී වේ. | තොග හානි වළක්වා ගැනීම සඳහා කලමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාවේ පවිත්‍රතා සේවය වෙනුවෙන් ගිවිසුමකට එළඹීමකින් තොරව පුද්ගලික ආයතනයක් වෙත රු.4,230,500 ක් ගෙවා තිබුණි. | 2019 වර්ෂයේ මිලටම 2019 වර්ෂයේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව තෝරා පත්කරගත් පවිත්‍රතා ආයතනයම මේ සඳහා යොදා ගෙන ඇති අතර 2019 වසරේ කොන්දේසින්ට යටත්වම සේවය ලබා ගෙන ඇත. | සේවා කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1969 අංක 12 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනත අනුව සංස්ථාවේ පහත සඳහන් අරමුණ ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.<br><br>(i) සමුපකාර සමිති වල අවශ්‍යතා ප්‍රසම්පාදනය හා සැපයීම<br><br>(ii) සියළු අකාරයේ භාණ්ඩ සම්බන්ධයෙන් අපනයනකරුවෙකු, ආනයනකරුවෙකු , තොග සහ සිල්ලර වෙළෙන්දෙකු වශයෙන් කටයුතු කිරීම<br><br>(iii) අදාළ අමාත්‍යවරයා සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය මත කෘෂිකාර්මික හා කාර්මික කටයුතු හෝ බැංකු සහ නාවික කටයුතු ඇතුළු වෙනත් වෙළඳ හෝ ව්‍යාපාරික කටයුතු සිදු කිරීම | 2020 වසර තුළ කොවිඩ් වසංගතය පැවතීම හේතුවෙන්, සතොස ආයතනයේ මුඛ්‍ය පරමාර්ථයෙන් බැහැරව රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිමෙහිලා සතොස ආයතනය කටයුතු කරන ලදි. ඒ අනුව අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය දිසාපති කාර්යාල මගින් බෙදාහැරීමේ වැඩ සටහන සඳහා සතොස පූර්ණ වශයෙන් ගබඩා/ ඇසුරුම්/ප්‍රවාහන අංශයන් උපයෝජනය කරන ලදි. | පනතේ අරමුණු ඉටු කර ගත යුතුය. |
| (ආ).සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ක්‍රියාකාරී සැලැස්ම අනුව මූල්‍ය කාර්යසාධනය ඉහල නැංවීමට සහ පාරිභෝගික තෘප්තිය වැඩිකිරීම සඳහා සැලසුම් කර තිබුණු පහත සඳහන් කාර්යයන් ඉටුකර නොතිබුණි. | | |
| (i). සුදු සීනි මෙට්‍රික් ටොන් 5000 ක් , රතු පරිප්පු මෙට්‍රික් ටොන් 3500 ක් , හාල් මැස්සො මෙට්‍රික් ටොන් 1000 ක් , ටින් මාළු මෙට්‍රික් ටොන් 5400 , සුදු ලූනු මෙට්‍රික් ටොන් 350 ක්, කඩල මෙට්‍රික් ටොන් 1350 ක් හා මුං ඇට මෙට්‍රික් ටොන් 1350 ක් සාධාරණ මිලට ආනයනය කිරීම | රටතුළ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් සංස්ථාව මගින් ආනයනය කිරීමට බලාපොරොත්තු වූ රතු පරිප්පු, සුදු සීනි, හාල් මැස්සන්, සුදුළූණු , ටින්මාළු,කඩල, හා මුංඇට ආනයනය කිරිමට අවස්ථාව නොලැබුණි. | සැලසුම් කරන ලද කාර්යයන් හැකි පමණකින් හෝ ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii). රතු සීනි මෙට්‍රික් ටොන් 5500 ක් දේශීයව සාධාරණ මිලට මිලදී ගැනීම | කොවිඩ් ව්‍යාපෘතිය තුළ රටතුළ නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම හා සංචරණ සීමා පැවතිම තුලද එම වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | -එම- |
| (iii). වාහන නැවතුම් ආදායම රු. මිලියන 14.5 කින් ඉහල නැංවීම | 2020 වර්ෂයේ රටතුළ පැතිරී ගිය කොවිඩ් වසංගත තත්වය පැවතීම හේතුවෙන් නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම, සංචරණ සීමා පැනවීම, ආදී කරුණු නිසා කොළඹට රථ වාහන පැමිණීම සීමාවීම මත ආදායම් ප්‍රතිශතය වැඩිකර ගැනීමට නොහැකි වී ඇත. | -එම- |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව සතුව වාහන 109 ක් පැවති අතර ඉන් වාහන 21 ක් ධාවනයෙන් ඉවත් කර සමස්ත වර්ෂය තුළ නිශ්කාර්යව පැවතුනි. | 2020 වර්ෂයේ වාහන 109 ක් පැවතියද, ඉන් වාහන 11 ක් ටෙන්ඩර් මගින් විකුණා ඇත. තවත් වාහන 10 ක් ටෙන්ඩර් මගින් ඉවත් කිරීම සඳහා ධාවනයෙන් ඉවත් කර තිබුණි. | අපහරණය කිරීමට අපේක්ෂිත වාහන සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) සංස්ථාව සතු හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව සහල් සැකසීමේ සංකීර්ණය වසර ගණනාවක සිට ඌණඋපයෝජිතව පවතින අතර සහල් සංකීර්ණ දෙකෙහිම පැයකට සහල් කි.ග්‍රෑ 2000 ක් සැකසීමේ ධාරිතාවයක් පවතියි. කෙසේ වුවද ,සමාලෝචිත වර්ෂයේදී පන්නෙගමුව සහල් සැකසීමේ සංකීර්ණයේ සහල් කි.ග්‍රෑ. 372,800 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. තවද, එම සංකීර්ණයේ සමාලෝචිත වර්ෂය තුළදී සේවකයන් 13ක සිට 21ක් දක්වා සංඛ්‍යාවක් එහි සේවයේ යොදවා තිබුණු අතර වැටුප් , අතිකාල සහ අනෙකුත් දීමනා වශයෙන් රු.10,948,807 ක් ගෙවා තිබුණි. හිඟුරක්ගොඩ සහල් සැකසීමේ | මෙම සංකීර්ණ දෙක සඳහා වී අලෙවි මණ්ඩලයෙන් වී තොග සපයා ගනු ලබන අතර ඔවුන් අත්පිට මුදලට පමණක් වී තොග නිකුත් කිරීම සිදු කරනු ලබයි.<br>ඒ අනුව 2020 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය සතුව පැවති වී තොග සීමාසහිත වූ අතර එම තොග සතොස වෙත හා පුද්ගලික අංශය වෙත එකවර නිකුත් කිරීම සිදු කරන ලදී. එහිදී සතොස වෙත එම කාලය තුළ ලබා ගත හැකි වූ වී තොග ප්‍රමාණය පමණක් ඇඹරීම සිදු කරන ලදී.<br>තවද, සතොස සෘජුවම වී තොග මිළදී ගැනීම සිදු කර නොමැති අතර ගොවීන්ගෙන් ප්‍රධාන | සංස්ථාවේ දේපල ආදායම් ඉපයීම සඳහා කාර්යක්ෂමව යොදාගත යුතුය. |

| | | |
|---|---|---|
| සංකීර්ණයේ සමාලෝචිත වර්ෂයේදී කාර්යමණ්ඩලය 06 ක් යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් වැටුප් , අතිකාල සහ අනෙකුත් දීමනා වශයෙන් රු.2,902,590 ක් ගෙවා තිබුණි. එහි සමාලෝචිත වර්ෂය තුල සහල් කි.ග්‍රෑ. 309,550 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. | වශයෙන් තෙත සහිත වී නිශ්පාදනය වන බැවින් හා එම වී තොග මිළදී ගෙන ඇඹරීම සඳහා මාස කීපයක් ගබඩාගතව පවත්වා ගැනීමට අවශ්‍ය වී වියළීමේ පහසුකම සතොස සතුව නොමැත. තවද මෙම සංකීර්ණ දෙක සඳහා ආරක්ෂක අංශය ඇතුළුව සතොස සේවකයින් යොදවා ඇත. | |

**3.5 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ)සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ කොවිඩ් මෙහෙයුම් ව්‍යාපෘතිය යටතේ කොවිඩ් වසංගත සමයේ පාරිභෝගිකයන්ට සැපයීම සඳහා රු.666,559,566 ක් පිරිවැය වූ ටින්මාලු ටින් 3,302,968 ක් රු. 233,985,325 ක් පිරිවැය වූ රතු පරිප්පු කි.ග්‍රෑ.1,691,725 ක්, රු.48,790,557 ක් පිරිවැය වූ ලොකුළුණු කි.ග්‍රෑ. 375,158 ක් හා රු.5,652,104 ක් පිරිවැය වූ අර්තාපල් කි.ග්‍රෑ.30,858 ක් සහ පිරිවැය රු.10,531,320 ක් වූ සුදුළුණු කි.ග්‍රෑ.23,560 ක් ද මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) අදාළ මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් ඇස්තමේන්තුවක් සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර සකස්කර නොතිබුණි. | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවක් මගින් ප්‍රසම්පාදන කටයුතු කරන ලදි. අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයුම් කරුවන් වෙතින් මිල ගණන් ලබා ගැනීම එම කමිටුව විසින් සිදු කරන ලදි. දිවයින තුළ පැවති නිරෝධායන ඇඳිරිනීති තත්වය මත මිලදී ගැණුම් හා බෙදාහැරීම් කටයුතු ඉතා දුෂ්කරතා හමුවේ වූ බැවින් අදාළ ප්‍රසම්පාදන් ස්ථිතිය මගින් මෙම පිරිවිතර හා හෝ ඇස්තමේන්තු රහිතව ප්‍රසම්පාදනය කිරීමට තීරණය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීම සඳහා දී ඇති කාලය අදාළ ලංසු පිළියෙල කිරීම සඳහා සාධාරණ ලෙස ප්‍රමාණවත් විය යුතු වුවද ටින්මාලු සහ පරිප්පු මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන්ට මිල ගණන් ඉදිරිපත් කිරීම වෙනුවෙන් මිනිත්තු 30 ක කාලයක් පමණක් ලබා දීම හේතුවෙන් තරඟකාරි මිල ගණන් ලබාගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | නිරෝධායන ඇඳිරිනීති තත්වය තුළ සැපයුම්කරුවන් කැඳවා ගැනීම දුෂ්කරවීම, රට තුළ ආහාර හිඟයක් ඇතිවීම වැලක්වීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත කඩිනමින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම කළ යුතු වීම වැනි ප්‍රායෝගික දුෂ්කරතා මේ සඳහා බලපා ඇත. | -එම- |
| (iii).ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල , දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් සිදු කල යුතු වුවද සංස්ථාව විසින් පෞද්ගලික සමාගමක් වෙත ටින් මාලු ටින් 100,000 ක් අලෙවි කර තිබුණි. මීට අදාළ රු.9,286,000 ක මුදල මහා භාණ්ඩාගාරය විසින් සංස්ථාව වෙත ප්‍රතිපූරණය කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. | ත්‍රිවිධ හමුදාව වෙත ආහාර ද්‍රව්‍ය සැපයුම්කරුවෙකුට ත්‍රිවිධ හමුදාවේ අවශ්‍යතා සඳහා බෙදාහැරීමට මෙම ටින්මාළු 100,000 සපයා ඇත. මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලයද කරුණු විමසා ඇති අතර , එවකට අමාත්‍යාංශ ලේකම් පොලිස්පති වෙත මේ සම්බන්ධයෙන් පැමිණිලි කර ඇති අතර අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින්ද පරීක්ෂණයක් පවත්වයි. | මහා භාණ්ඩාගාර යෙන් වියදම් ප්‍රතිපූරණය කර ගත හැකි පරිදි අදාළ කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv).මිලදී ගන්නා ලද ලොකු ලූණු කි.ග්‍රෑ.4,108 ක් අර්තාපල් කි.ග්‍රෑ.6,050 ක් සහ සුදු ලූණු කි.ග්‍රෑ. 445.5 ක් පරිභෝජනයට නුසුදුසු වීම හේතුවෙන් විනාශ කර තිබුණු අතර එම ද්‍රව්‍යවල මුළු පිරිවැය රු.1,830,171 ක් වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගන්නා ලද මුළු භාණ්ඩ තොගයේ වටිනාකම දළ වශයෙන් රු. මිලියන 1135 කි. මාස 03ක් වැනි කෙටි කාලයක් තුළ මෙවැනි විශාල භාණ්ඩ තොගයක් නිරෝධායන ඇඳිරි නීති පසුබිමක් තුළ මෙහෙයුම් කිරිමේදි මෙම නෂ්ඨවිය හැකි ආහාර ද්‍රව්‍ය නෂ්ඨ වී ඇත. | තොග හානි අවම කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (v) මිලදී ගෙන තිබූ ලොකු ළූණු කි.ග්‍රෑ. 375,158 න් කිලෝ 363,633 ක් අලෙවිකර තිබූ අතර කිලෝ 4,108 ක් විනාශකර තිබුණි. ඒ අනුව කි.ග්‍රෑ. 7,417 ක අඩුමාන නිරීක්ෂණය වූ අතර අර්තාපල් කි.ග්‍රෑ. 30,858 න් කිලෝ 23,513 ක් නිකුත්කර තිබුණි. ඒ අතරින් කි.ග්‍රෑ. 6,050 ක් විනාශ කර තිබුණු අතර කි.ග්‍රෑ.1,295 ක අඩුමාන නිරීක්ෂණය විය. එසේම ව්‍යාපෘතිය යටතේ ටින් මාළු ටින් 3,302,968 ක් මිලදී ගෙන තිබූ අතර ටින් 3,302,491 ක් අලෙවිකර තිබුණි. ඒ අනුව ටින් | ඉතාම කෙටිකාලයක් තුළ දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු මඟින් කඩිනමින් සපයන ලෙසට ඉදිරිපත් වන ඇණවුම් සඳහා ආහාර කොමසාරිස් විසින් කරනු ලබන ඉල්ලීම් නිරෝධායන ඇඳිරිනීති පසුබිම තුළ සිදුවීමේදි මෙම තත්වය සිදුවී ඇතැයි නිරීක්ෂණය වේ. | අඩුමාන අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මාළු 477 ක අඩුමාන නිරීක්ෂණය විය. විගණනයේ ගණනයකිරීම් අනුව ඉහත අඩුමාන හේතුවෙන් සංස්ථාවට සිදු වූ පාඩුව රු.1,303,880 ක් වී තිබුණි. | | |
| (vi) | ඇසුරුම් කර නැවත ලබා දීම සඳහා ලංකා සතොස සමාගම විසින් සංස්ථාව වෙත ලබා දුන් රතු පරිප්පු කි.ග්‍රෑ.15,250 ක් සංස්ථාව විසින් ඉහත ව්‍යාපෘතිය යටතේ රු.65 කට පාරිභෝගිකයන් වෙත අලෙවි කර තිබුණි.කෙසේ වුවද ඒ වෙනුවෙන් කි.ග්‍රෑ.01 කට රු.128 බැගින් ලංකා සතොස සමාගමට ගෙවීමට සංස්ථාවට සිදු වී තිබුණි.කොවිඩ් ව්‍යාපෘතිය යටතේ සහනදායී මිල ගණන්වලට මෙම ගනුදෙනුව සිදු නොවීම හේතුවෙන් කිලෝග්‍රෑම් එකක් සඳහා වැඩිපුර ගෙවන ලද රු.63 ක මුදල මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූරණය නොකිරීම හේතුවෙන් රු.960,750 ක අලාභයක් දැරීමට සංස්ථාවට සිදු වී තිබුණි. | අංක 2167/9 දරණ 2020 මාර්තු 17 දිනැති ගැසට් පත්‍රය අනුව එම අවස්ථාවේදි මයිසූර් පරිප්පු (රතු පරිප්පු) විකිණිය හැකි උපරිම සිල්ලර මිල කිලෝ ග්‍රෑම් 01ක් රු. 65/=ක් පමණි. ලංකා සතොස ආයතනය විසින් වුවද, මෙම පරිප්පු තොගය එම අවස්ථාවේදි විකුණුම් කලේ නම් උපරිම සිල්ලර මිල රු. 65/= පමණි. ඒ අනුව සතොස ආයතනය වෙතින් වැඩිපුර අය කිරීම ලංකා සතොස මූල්‍ය අංශය විසින් සිදුකරන ලද වැරදි ක්‍රියාවකි. ඒ පිළිබඳව අප විසින් විරෝධය ප්‍රකාශ කරමින් ලිපියක් ඉදිරිපත් කර ඇත. | මහා භාණ්ඩාගාර යෙන් වියදම් ප්‍රතිපූරණය කර ගත හැකි පරිදි අදාල කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2019 වර්ෂයේදී සංස්ථාව සතු ගබඩා 13 ක් නවීකරණය කිරීම ආරම්භකර තිබුණු අතර නවීකරණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.72,356,234 ක් වැයකර තිබුණි. එම සියළුම නවීකරණ කටයුතු 2020 වර්ෂය තුළ අවසන් කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගබඩා 06 ක පමණක් නවීකරණ කටයුතු අවසන් කර තිබුණි. | පෙර අමාත්‍යාංශය යටතේ පැවති අය-වැය ප්‍රතිපාදන මුදල් නව අමාත්‍යාංශය වෙත ලබා ගැනීම සඳහා දිගුකාලයක් ගත වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත මුදල් ගෙවීම දිගුකලක් ප්‍රමාදවීම.එම තත්වය තුළ ප්‍රමාණ පත්‍රයෙහි සඳහන් මිල මට්ටම්ද ආර්ථිකය තුළ වැඩි වීම ව්‍යාපෘතිය භාරව කටයුතු කළ සමාගමේ ඉංජිනේරුවරයා අත් අඩංගුවට පත්වීම, එම සමාගම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීම ප්‍රමාද වීම හා එහි හිටපු ප්‍රධාන විධායක සහ ප්‍රධාන ඉංජිනේරුවරයා ඉවත්වීම. දිවයිනතුල සීඝ්‍රයෙන් පැතිර ගිය කොවිඩ් - 19 වෛරස වසංගතය යන කරුණු හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ වැඩ අධීක්ෂණයද ගැටළු සහගත තත්වයට පත්විය. එසේ වුවද, මේ වන විට මෙම ගබඩා 13 න් 09 ක නවීකරණ කටයුතු අවසන් කර ඇත. | සැලසුම් කළ කාර්යයන් නියමිත කාලය තුළ ඉටු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ වාහන සඳහා ටයර් ටියුබ් හා කොලර් කට්ටල 100 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් මිලදී ගැනීමට නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද ප්‍රසම්පාදන කමිටු නිර්දේශයට පටහැනිව රු.5,531,240 ක් වැය කර උපකරණ කට්ටල 100 ක් ඉහත ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මිල ගණන් ඉදිරිපත් නොකල පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය පරිදි සතොස විසින් ගැණුම් ඇණවුමක් ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත යොමු කරන නමුත් ඒම ආයතනය විසින් මෙම ඇණවුමට අදාළව ටයර් නිකුත් කිරීමට නොහැකි බව දැනුම් දී ඇත.<br>එම නිසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ (9.2) 9.2.1 වගන්තියට අනුව ප්‍රවාහන අමතර කොටස් අදාළ දේශීය නියෝජිත ආයතනවලින් මිළදී ගැනීමට හැකියාව ඇති හෙයින් ඇපලෝ මාදිලියේ ටයර්/ටියුබ් හා කොලර් දේශීයව සපයන එකම ආයතනය වන අයිඩියල් වීල්ස් ඇන්ඩ් ටයර්ස් (පුද්) සමාගමෙන් මිළ කැඳවුමක් ලබාගෙන මිළදී ගෙන ඇත. | ප්‍රසම්පාදන කමිටු නිර්දේශ ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථාවකදී නැවත ප්‍රසම්පාදන කමිටු නිර්දේශ ලබා ගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ කලමණාකාර සහකාර තනතුරු 37 ක් අනුමත වී තිබුණු අතර තථ්‍ය කාර්යමණ්ඩලය 23 ක් වී තිබුණි. කාර්ය සහායක අනුමත කාර්ය මණ්ඩලය 120 ක් වූ අතර තථ්‍ය කාර්යමණ්ඩලය 114 ක් ද විය. කලමණාකාර සහකාර තනතුරු සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැදගත් පරිපාලනමය සහ මූල්‍යමය විෂයයන් කාර්ය සහායක තනතුරු දරන සේවකයින් විසින් ආවරණය කර තිබුණි. | 2020 වර්ෂය තුළ කොවිඩ් 19 ව්‍යාප්තිය හේතුවෙන් රජය විසින් නිරෝධායන ඇදිරිනීතිය පනවා තිබීම, සංචරන සීමා පනවා තිබීම ආද හේතු මෙන්ම, රජයේ කාර්යාල අත්‍යාවශ්‍ය සේවකයන් පමණක් කැඳවා පවත්වා ගෙන යාම මතද බඳවා ගැනීම් කිරීමට නොහැකි වී ඇති අතර මේ වනවිට සේවක බඳවා ගැනීම් රජයේ ප්‍රතිපත්ති තීරණයක් මත තාවකාලිකව නවතා ඇත. | වැදගත් පරිපාලනමය සහ මූල්‍යමය විෂයයන් සුදුසුකම් ලත් නිලධාරීන් මගින් ඉටු කරවා ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මාස 21 ක ප්‍රමාද කාලයකින් පසුව 2022 නොවැම්බර් 22 වන දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | එකග වෙමි. සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන සතොස ඉදිකිරීම් සහ ඉංජිනේරු සමාගමේ 2017 , 2018 , 2019 වර්ෂ වලට අයත් මූල්‍ය ප්‍රකාශන පිළියල කර ඒකාබද්ධ ගිණුම් සකස් කිරීමට වසරක් පමණ ප්‍රමාද වීම නිසා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම සහ විගණනයට ඉදිරිපත් කිරීමට ප්‍රමාද වූ බව දන්වා සිටිමි. 2020 වසරේ විගණනය අවසන් කල පසු 2021 වසරේ මූල්‍ය ප්‍රකාශන විගණනයට යොමුකරන අතර 2022 වසරේ මූල්‍ය ප්‍රකාශනද 2023 වසරේදීම විගණනයට යොමු කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව 2023 වසරේ සිට නියමිත දිනයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු සැලසුම් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |